ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2023(2024 මාර්තු)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024 மார்ச்)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2023 (March 2024)

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
# வணிகக் கல்வியும் கணக்கீடும் I, II
# Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත් :** ❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5කටපමණක් පිළිතුරු සපයන්න.

- ❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

❖ පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අත්කම් නිර්මාණ පිළිබඳ එක් අවුරුදු පාඨමාලාවක් හදාරා සිටි සිතාරි ව්‍යවසාය දැක්මක් ඇති තරුණියකි. ඇගළුම් කම්හල් බහුලව පවතින ප්‍රදේශයක ජීවත් වන සිතාරි ඒවායින් ඉවත්වන කැබලි රෙදි උපයෝගි කරගෙන විවිධ නිර්මාණ සකස් කර අළෙවි කිරීමේ ව්‍යාපාරයක් 2023.01.01 දින **සිහින අත්කම්** නමින් ඇරඹීය. ඇය සතුව තිබු රු. 25,000ක මුදලක් සිය මවගෙන් ලැබුණු රු. 40,000ක් වටිනා මහන මැෂිමක් ව්‍යාපාරයට යොදවා සංචාරක කලාපයක් ආශ්‍රිත නගරයක ගොඩනැගිල්ලක් කුලියට ගෙන ව්‍යාපාරය ආරම්භ කෙරුණි. 2023.01.15 දින මසකට රු. 20,000ක වැටුපකට සේවකයකු බඳවා ගන්නා ලදි.

2023 ජනවාරි මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

| | |
|---|---|
| කැබලි රෙදි මිලදී ගැණුම් | රු. 60,000 |
| ප්‍රවාහන කුලි | රු. 4,000 |
| උපකරණ මිලට ගත්තා | රු. 60,000 |
| මාසික විදුලි බිල ගෙව්වා | රු. 2,000 |
| විකුණුම් ආදායම් | රු. 140,000 |
| ගොඩනැගිලි කුලි ගෙව්වා | රු. 20,000 |
| තිමිර ගාමන්ට් වෙතින් රෙදි මිලදී ගැණුම් | රු. 25,000 |
| සපුමල් ව්‍යාපාරයට විකුණුම් | රු. 15,000 |
| බැංකු ණය ගත්තා | රු. 50,000 |

2023.01.31 දිනට ඉතිරි ද්‍රව්‍ය රු. 8,000 යි. ඉහත බැංකු ණය මුදල ලබා ගෙන ඇත්තේ 2023.01.01 දින 12% වාර්ෂික පොළියට ය. 2024 වසරේ සිට තම වෙළෙඳ කටයුතු විද්‍යුත් වෙළෙඳාම හරහා සිදු කිරීමට සිතාරි තීරණය කර ඇත.

(i) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව **සිහින අත්කම්** ව්‍යාපාරය කුමන වර්ගයේ ව්‍යාපාරයක් ද ?

(ii) අ. සිහින අත්කම් ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් ලියන්න.
ආ. එම ව්‍යාපාරයේ දැකිය හැකි අවස්ථාවක් ලියන්න.

(iii) අ. සිහින අත්කම් ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද?
ආ. එය ලියාපදිංචි කළ යුතු පණත කුමක් ද?

(iv) ඉහත සිද්ධියේ ඇල්මැති පාර්ශව පාර්ශව 4ක් නම් කරන්න.

(v) සිහින අත්කම් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය යෙදීමේ ගනුදෙනුවට අදාල ද්විත්ව බලපෑම දක්වන්න.

(vi) මෙම ව්‍යාපාරය පවත්වා ගත යුතු මූලික සටහන් පොත් දෙකක් ලියන්න.

(vii) 2023.01.31 දිනට ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කරන්න.

(viii) 2023.01.31 දිනට ගෙවිය යුතු ණය පොලිය කීයද ?

(ix) 2023.01.31 දිනට ජංගම වත්කමක් හා ජංගම වගකීමක් අගයයන් සහිතව ලියන්න.

(x) ණයගැතියන්ගෙන් ඉක්මනින් මුදල් ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය කුමක් ද ?

(ලකුණු 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්ණ **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

02. (i) නිෂ්පාදිනය කරනු ලබන නිෂ්පාදිත වල ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කරන අකාර දෙක දක්වන්න.

(ii) හලාවත පදිංචි කොඩිතුවක්කු මහතා ඉවතලන පොල් කටු භාවිත කර ඉතා අනර්ඝ විසිතුරු නිර්මාණය කර අළෙවි කරයි. නවෝත්පාදන බිහිකිරීම ඔහුගේ අපේක්ෂාව වන අතර වර්තමාන ආර්ථික පරිහානිය තුළ ආදායම් වලට ද ව්‍යාපාරික වශයෙන් ඔශු මුහුණ දී ඇත.

අ. කොඩිතුවක්කුගේ මෙම ක්‍රියාවලිය කුමන නිෂ්පාදන සාධකයකට අයත්වේ ද?

ආ. ඔබ (අ) හි නම් කළ නිෂ්පාදක සාධකය හඳුන්වන්න.

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම බාහිර පරිසර සාධකයක් ලෙස දේශපාලන පරිසරයට අයත්වේ.

ආ. පිලිගත් සන්නම් නාමයක් පැවතීම එම ව්‍යාපාරයට අවස්ථාවකි.

ඉ. රාජ්‍ය සංස්ථාවක් උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරයි.

ඊ. සකස් කළ ආහාර පාන අළෙවි කිරීම සේවා සැපයීමේ ව්‍යාපාරයකට නිදසුනකි.

(iv) ගෝලීයකරණය නිසා ව්‍යාපාර ලෝකය සීඝ්‍රයෙන් වෙනස්වන නමුදු ව්‍යාපාර වලට දැඩි තරගකාරිත්වයකට මුහුණ දීමට සිදුවේ. ගෝලීය පරිසරයෙන් දේශිය ව්‍යාපාර කෙරෙහි සිදුකරන හිතකර බලපෑම් 2ක් හා අහිතකර බලපෑම් දෙකක් ලියන්න.

(ලකුණු 8 යි)

03. (i) අ. ව්‍යාපාර සංවිධාන හිමිකාරිත්වය අනුව වර්ගීකරණය කරන්න.

ආ. රජයේ ආර්ථික ප්‍රතිපත්ති සෘජුවම ව්‍යාපාර කෙරෙහි බලපායි. එවැනි ප්‍රතිපත්ති දෙකක් නම් කරන්න.

(ii) පහත දැක්වෙන ව්‍යාපාර ආයතන අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

- ❖ රත්න සහ සහෝදරයෝ
- ❖ තිලංග ස්ටෝර්ස්
- ❖ ලංකා ඔටෝ මොබයිල් සංගමය
- ❖ මාර්ග සංවර්ධන අධිකාරිය.

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු. 1,000 වැඩි නම් වංචා වැළැක්වීමේ ආඥා පණතට අනුව ලිඛිතව ආරම්භ කළ යුතුය.

ආ. හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම, හවුල් ව්‍යාපාරයක වාසියක් වන අතර අසීමිත වගකීමක් තිබීම තනි ව්‍යාපාරයක වාසියකි.

ඉ. පොල් සංවර්ධන අධිකාරිය, ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය රාජ්‍ය සංස්ථා යටතට අයත් වේ.

ඊ. ගෝලීයකරණය හේතුවෙන් දේශීය කුඩා ව්‍යාපාර වල පැවැත්ම ස්ථාවර වේ.

(iv) අ. තනි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර වල දැකිය හැකි සමාන ලක්ෂණ දෙකක් ලියන්න.

ආ. තනි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ බලධාරියා කවු ද?

(ලකුණු 8 යි)

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.)

04\. i. "සුදාගේ" ව්‍යාපාරයේ 2024.01.01 දිනට මුළු වත්කම් හා වගකීම් පහත වේ.

| | | | |
|---|---|---|---|
| ලී බඩු | රු. 200,000 | බඩුතොගය | රු. 120.000 |
| ණයගැතියෝ | රු. 40,000 | මුදල් ශේෂය | රු. 80,000 |
| ණයහිමියෝ | රු. 25,000 | | |

2024 ජනවාරි මාසයේ සුදාගේ ව්‍යාපාරයේ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත වේ.

| | වත්කම් | | | = | හිමිකම + | වගකීම් |
|---|---|---|---|---|---|---|
| | **ලී බඩු** | **බඩුතොගය** | **ණයගැති** | **මුදල්** | **හිමිකම** | **ණයහිමියෝ** |
| 1/8 | | | | - 15,000 | -15,000 (වැටුප්) | |
| 1/14 | | | - 10,000 | + 10,000 | | |
| 1/20 | | + 12,000 | | | | + 12,000 |
| 1/24 | - 20,000 | | | + 20,000 | | |
| 1/29 | | - 20,000 | + 30,000 | | + 10,000 (ලාභය) | |

**අවශ්‍ය වන්නේ,**

අ. 2024.01.08 දින සිදු වී ඇති ගනුදෙනුව වටිනාකම් සහිතව ලියන්න.

ආ. 2024.01.29 දිනට හිමිකම කීය ද?

ඉ. 2024.01.31 දිනට ජංගම වත්කම් වල වටිනාකම සොයන්න.

ඊ. 2024.01.31 රු. 100,000ක් වටිනා ලී බඩු සුදා විසින් ව්‍යාපාරයට යෙදවීම ඉහත සමීකරණයට බලපාන අයුරු පෙන්වන්න.

ii. "යෂ් ගේ" ව්‍යාපාරයේ 2023 ඔක්තෝම්බර් මාසයේ පිළියෙල කල බැංකු ගිණුම හා බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශණය පහත දැක්වේ.

**බැංකු ගිණුම**

| දිනය | ල.අ. | විස්තරය | ස.පි. | බැංකු | දිනය | ව.අ. | විස්තරය | ස.පි. | බැංකු |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10/1 | | ශේෂය | | 44,000 | 10/7 | | ණයහිමි 3342 | | 7,000 |
| 10/10 | | චෙක් තැන්පත් 6234 | | 10,200 | 10/12 | | වැටුප් 3343 | | 5,000 |
| 10/24 | | චෙක් තැන්පත් 7185 | | 15,000 | 10/28 | | ගැණුම් 3344 | | 18,000 |
| | | | | | 10/31 | | ශේෂය ප/ගෙ | | 39,200 |
| | | | | 69,200 | | | | | 69,200 |
| 11/1 | | ශේෂය ඉ/ගෙ | | 39,200 | | | | | |

**බැංකු ප්‍රකාශණය**

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 10/1 | ශේෂය | | | 44,000 |
| 10/8 | චෙක් අංක 3342 | 7,000 | | 37,000 |
| 10/11 | චෙක් තැන්පත් 6234 | | 10,200 | 47,200 |
| 10/13 | චෙක් අංක 3343 | 5,000 | | 42,200 |
| 10/20 | ස්ථාවර නියෝග (ණය පොලි) | 8,000 | | 34,200 |
| 10/29 | සෘජු ප්‍රේෂණ | | 11,800 | 46,000 |

**අවශ්‍ය වන්නේ,**

අ. 2023.10.31 දිනට සංශෝධිත බැංකු ගිණුම.

ආ. 2023.10.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියල කරන්න.

iii. පහත දැක්වෙන ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

අ. ප්‍රාග්ධනය යෙදුවා රු. 100,000

ආ. අත්පිට විකුණුම් රු. 45,500

ඉ. ණයට භාණ්ඩ ගත්තා රු. 22,000

ඊ. බැංකු ණයක් ගත්තා රු. 50,000

(ලකුණු 12 යි)

05. i. පහත දැක්වෙන්නේ එක්තරා ව්‍යාපාරයක 2023 මැයි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයකි.

| | |
|---|---|
| 2023.05.01 | මදුෂාන්ට ණයට විකුණුම් |
| | 1ක් රු. 275 බැගින් සැමන් ටින් 10 |
| | 1ක් ර. 650 බැගින් කෝඩියල් බෝතල් 05 |
| 2023.05.04 | ලක්ෂාන්ගෙන් ණයට ගැණුම් |
| | 1Kg ක් රු. 200 බැගින් සුදු හාල් කිලෝ 25 |
| | 1Kg ක් රු. 250 බැගින් සම්බා හාල් කිලෝ 20 |
| 2023.05.09 | සිරිමල්ගෙන් රු. 50,000කට අල්මාරියක් ගත්තා |
| 2023.05.15 | නාමල්ට ණයට විකුණුම් |
| | දුසිමක් රු. 960 බැගින් අභ්‍යාස පොත් 20 |
| | දුසිමක් රු. 240 බැගින් පෑන් 50 |
| 2023.05.22 | රමේෂ්ගෙන් ණයට ගැණුම් |
| | එකක් රු. 280 බැගින් මදුරු දගර පෙට්ටි දුසිම් 03 |
| | බෝතලයක් රු. 700 බැගින් ලයිසෝල් බෝතල් දුසිම් 01 |
| 2023.05.28 | රු. 30,000කට යන්ත්‍රයක් ණයට ගත්තා. |

ඉහත ගනුදෙනු අදාල උපයෝගි පොත් වල සටහන් කරන්න

ii. පහත දැක්වෙන්නේ සදමල්ගේ ව්‍යාපාරයේ සිදුවූ සුළු වියදම් පිළිබඳ ගනුදෙනු කිහිපයකි.

| | | |
|---|---|---|
| 1/1 | ශේෂය ඉ/ගෙ | රු. 1,200 |
| | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | රු. 2,800 |
| 1/2 | මුද්දර ගත්තා | රු. 200 |
| 1/5 | බස් ගාස්තු ගෙව්වා | රු. 150 |
| 1/8 | පෑන්, පැන්සල් ගත්තා | රු. 280 |
| 1/12 | විවිධ වියදම් | රු. 400 |
| 1/16 | සාගරට ගෙව්වා | රු. 800 |
| 1/18 | ගෙනඒමේ කුලි ගෙව්වා | රු. 470 |
| 1/22 | ලියුම් කවර ගත්තා | රු. 300 |
| 1/25 | ත්‍රීරෝද රථ ගාස්තු ගෙව්වා | රු. 350 |
| 1/27 | සංග්‍රහ ගාස්තු ගෙව්වා | රු. 250 |
| 1/28 | ලියන කඩදාසි ගත්තා | රු. 600 |
| 1/30 | මේසයක් ගත්තා | රු. 800 |

තැපල්, ගමන්, ලිපිද්‍රව්‍ය හා විවිධ යන විශ්ලේෂණ තීරු භාවිත කරමින් සුළු මුදල් පොතක් පිළියෙළ කරන්න.

(ලකුණු 12 යි)